# එළව එළවා පහර දෙමු

කිලිනොච්චියේ කුඩා ප්‍රදේශයකට කොටු වී සිටින ප්‍රභාකරන් නමැති කැණහිලා සාක් සම්මේලනය වෙනුවෙන් සිල් ගැනීමට සූදානම් වෙයි. ඔහුගේ ඊනියා තාවකාලික සටන් විරාමය කුමක් සඳහා ද යන්න නොදන්නා සේ හැසිරෙන අය ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවල ය. සාක් සම්මේලනයට පැමිණෙන විවිධ රටවල නායකයන් මුළා කර තම පැවැත්ම සහතික කර ගැනීමටත් ලංකාණ්ඩුවේ හමුදාවන්ට පහර දීමට තවත් අවස්ථාවක් ලබාගැනීමටත් ප්‍රභාකරන් නම් කැණහිලාට අවස්ථාව දීමට ආණ්ඩුව සූදානම් නැත. අද ඒකීය ලංකාවක් වෙනුවෙන් වීරෝදාරව සටන් වැද ඇති හමුදාවනට ද ඊනියා සටන් විරාමයක් අවශ්‍ය නැත.

එහෙත් කොටින් හැරෙන්නට සටන් විරාමයක් අවශ්‍ය වෙනත් අය ද වෙති. ඒ අතර එ ජා පක්‍ෂය ප්‍රධාන වෙයි. ඇතැම් පුවත්පත්වලට අනුව ඒ පක්‍ෂය කොටින්ගේ ව්‍යාජ සටන් විරාමය පිළිගැනීමට සූදානම් ය. බොහෝ විට රාවුෆ් හකීම්ගේ මුස්ලිම් කොංග්‍රසය ද සටන් විරාමය පිළිගනු ඇත. එයට අමතරව කොටින්ගේ පාර්ලිමේන්තු දේශපාලන පක්‍ෂය වූ  දෙමළ ජාතික සංධානය  සටන් විරාමයට ආවඩනු ඇත. එහෙත් ආණ්ඩුව ව්‍යාජ සටන් විරාමය ප්‍රතික්‍ෂෙප කිරීම රටේත් හමුදාවේත් යහපතට හේතු වෙයි.

මෙහි දී උතුරු මැද පළාතේ එ ජා පක්‍ෂයෙන් තරග කරන මහ ඇමති අපේක්‍ෂක ජානක පෙරේරා මහතා කියන්නේ කුමක් ද යන්න දැනගැනීම ඒ පළාතේ පමණක් නොව රටේ ම ජනතාවට වැදගත් ය. ඒ මහතා එ ජා පක්‍ෂය සමග සිටිමින් ව්‍යාජ සටන් විරාමය පිළිගන්නේ ද? එසේත් නැත්නම් හිටපු හමුදා නිලධාරියකු ලෙස ඒ ප්‍රතික්‍ෂෙප කරන්නේ ද? මේ ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකී සිටීමට  ඒ මහතාට හැකි කමක් නැත. ඒ මහතා හමුදාවේ සේවය කළ කාලයේ දී ක්‍රියා කෙළේ හුදෙක් එ ජා පක්‍ෂයට හිතවත් නිලධාරියකු ලෙස පමණක් ද යන්න ඒ ප්‍රශ්නවලට දෙන පිළිතුරු මගින් දැනගැනීමට හැකි වනු ඇත.

එ ජා පක්‍ෂ සමයේදීත් චන්ද්‍රිකා කුමාරතුංග පාලන අවධියේදීත් සටන් විරාමය ක්‍රියාත්මක වූ සැටි ජානක පෙරේරා මහතා නොදන්නවා විය නො හැකි ය. හමුදා කඳවුරු ඉදිරියට පැමිණ කොටි තම පශ්චාත් ප්‍රදේශය ප්‍රදර්ශනය කළ ආකාරය පිළිබඳ එකල වාර්තා විණි. තවත් සටන් විරාමයක් කුමක් සඳහා දැයි අමුතුවෙන් කිව යුතු නැත. අද කොටි කැණහිළුන් මෙන් දුවන බව සැබෑ ය. එහෙත් මොහොතකටවත් ඉඩක් දුන්නොත් කොටින්ගේ මිනීමරු ස්වරූපය නැවතත් මතුවනු ඇත.

කොටි දුර්වල වී කරගියා ගැනීමට කිසිවක් නොමැතිව සිටින මේ අවස්ථාවේ දී කළ යුතු එකම දෙය වනුයේ තව තවත් කොටින්ට එළව එළවා පහර දීම පමණ ය. ප්‍රභාකරන් ගල ගුහයෙන් ගන්නා තෙක් හමුදාවේ මානුෂික මෙහෙයුම් ඉදිරියට ම ගෙන යා යුතු ය. එහෙත් මේ තීරුවෙහි කලින් සඳහන් කර ඇති පරිදි විවිධ බලවේග ඊනියා තාවකාලික සටන් විරාමයක් ඇතිකිරීමට උත්සාහ දරනු ඇත.

අවුරුද්දකට වතාවක් බටහිර මුදලින් ඊනියා කළු ජූලිය සමරන රාජ්‍ය නොවන සංවිධානවලට එහි විසිපස්වැනි සංවත්සරය සැමරීමට තරම්වත් හැකියාවක් නො තිබුණි. රාජ්‍ය නොවන සංවිධානවලට මේ වසරේ ඒ සඳහා මුදල් නොලැබුණි යැයි සිතීමට නො හැකි ය. අවුරුදු විසි පහ සැමරීම වෙනුවෙන් ඇතැම් විට මේ වසරේ වෙන වසරවලට ද වඩා මුදල් ලැබෙන්නට ඇත. වෙන අයට බයිලා කියන මේ රාජ්‍ය නොවන සංවිධානවල හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල   පාරදෘශ්‍යතාව කෙසේ ද?

ආණ්ඩුව තාවකාලික සටන් විරාමය ප්‍රතික්‍ෂෙප කර තිබුණ ද, බටහිරයන් හා ඔවුන්ගේ ගැත්තන් වූ අනුකාරකයන් තම උත්සාහය අත් නොහරිනු ඇත. ඔවුන් විවිධ ආකාරයෙන් ආණ්ඩුවට බලපෑම් කරනු ඇත. එහෙත් අප ගිය සතියේ සඳහන් කළ ආකාරයට ආණ්ඩුව කෙලින් සිටින්නේ නම් බටහිරයන්ට හා ඔවුන්ගේ  ගැත්තන්ට ආණ්ඩුවට විරුද්ධව කළ හැකි ඉටි ගෙඩියක් නැත. ඇතැම් ජඩමාධ්‍යවලින් මේ ගැත්තන් උඩට නුසවන්නට ගැත්තන්ට මේ වන විටත් යන එන මං නැතිව ගොස් ය.

© Prof. Nalin De Silva

ආණ්ඩුව කළ යුත්තේ බටහිරයන්ගේ බහට කන් නොදීම පමණකි. බොරු ප්‍රජාතන්ත්‍රවාදී මතිමතාන්තර පෙරදැරි කරගෙන බටහිරයන් ආණ්ඩුවට කරන බලපෑම්වලට දිය හැකි හොඳම පිළිතුර ලංකාණ්ඩුවට එරෙහි වූ බටහිරයන්ට කල් යල් බලා ආපසු හෙදර යෑමට මාර්ගය සකස් කර දීම පමණකි. ඔවුන් තම කසිකබල් සංකල්ප හා ප්‍රවාද ඔස්සේ අප බිය ගැන්වීමට  කටයුතු කරන බව අප සැමවිට ම මතක තබාගත යුතු ය.

ඊනියා කළු ජුලිය සැමරීම සඳහා යම්තමින් හෝ කටයුතු කළ කුඩා පිරිසක් තම වැයම කුමක් සඳහා දැයි ලියා තිබූ ප්‍රධාන සටන් පාඨයෙන් පෙන්නුම් කර තිබුණි. ඔවුන් අසා තිබුණේ ප්‍රශ්නයට විසඳුම යුද්ධය ද යන්න ය. එය ද ප්‍රශ්නයක් බැවින් පළමුව එයට පිළිතුරක් දිය යුතු ය. කොටි සංවිධානය සමූලඝාතනය නොකර ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය නම් විසඳිය නො හැකි ය. රාජ්‍ය නොවන සංවිධානවල මතවාද දැන් පරාජය වී ඇති බැවින් ඒ සංවිධානවල බැලයන් ගැන කරදර වීමට දෙයක් නැත. එසේ නොවී නම් කිසිම දවසක නිර්මාණශීලී නොවූ මොවුන්ට එරෙහිව මතවාදී අරගලයක් කිරීම ද කළ යුතුව තිබුණි.

ඊනියා කළු ජුලියෙන් තම බඩ වියත රැකගන්නා පිරිස් ප්‍රශ්නයට විසඳුම යුද්ධය දැයි අසන විට ඉන් කියැවෙන්නේ අන් කිසිවක් නොව වහාම කොටි කැණහිළුන්ට එරෙහිව කරන සටන් නවත්වන ලෙස ය. එසේ නවතා සිංහලයන්ට එරෙහිව කටයුතු කිරීමට කොටින්ට තවත් ඉඩකඩ සපයන ලෙස ය. කොටි සිංහලයන් බහුතරයක් වාසය කරන ප්‍රදේශවල බෝම්බ පුපුරවන විට නිසොල්මනේ තම නිවෙස්වල හා රාජ්‍ය නොවන ගුබ්බෑයම්වල කල්ගත කරන මොවුන් කොටි පරදින විට වැස්සත් සමග මතුවන කුඩැල්ලන් මෙන් කොටි වෙනුවෙන් කෑ ගැසීමට ඉදිරිපත්වන්නේ තම බටහිර ස්වාමිවරුන්ගේ අවශ්‍යතාව පරිදි සිංහලයන්ගේ ලේ බීමට ය.

ඊනියා කළු ජුලියෙන් යැපෙන්නන් හා අනෙක් ඊනියා ප්‍රබුද්ධයන් කුමක් කීවත් මෙරට ජනවාර්ගික ප්‍රශ්නය නමින් හැඳින්වෙන්නේ සිංහල සංස්කෘතියට හිමි තැන අහිමි කිරීම ය. සිංහල සංස්කෘතියට, විශේෂිත ව කියන්නේ නම් සිංහල බෞද්ධ සංස්කෘතියට, මෙරට හිමි තැන අහිමි කිරීම ඇරඹුණේ  පෘතුගීසීන් මෙරටට පැමිණීමෙන් පසුව ය. ඉංගිරිසි ආක්‍රමණිකයෝ ඒ ක්‍රියාදාමය උච්චස්ථානයකට ගෙන ආවෝ ය. පෘතුගීසි ආක්‍රමණිකයන්ගේ කාලයේ සිට ම සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන ලබාගැනීම සඳහා කටයුතු කළ විශාල පිරිසක් වූහ. අදත් විශාල පිරිසක් වෙති. එහෙත් තවමත් මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි විය යුතු තැන ලැබී නැත.

කොටි කැණහිළුන්ට එරෙහිව කරන මෙහෙයුම් සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන ලබාගැනීමේ සටනේ ප්‍රධාන ම තැන ගන්නා බව සැබෑ නමුත් ඒ කැණහිළුන්ට එළව එළවා පහර දිය යුතු නමුත් කොටි සංවිධානය සමූලඝාතනය කිරීමෙන් පසුව සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන ලැබේවි යැයි නො සිතිය යුතු ය. ඒ තැන ලබාගැනීම සඳහා කළයුතු දෑ හා කළ යුතුව තිබූ දෑ බොහෝ වෙයි. අද සාර්ථක ව අවසානයක් දැක ඇති රාජ්‍ය නොවන ගුබ්බෑයම්වල මතවාද පරාජයකිරීම ඉන් එකක් පමණකි.

ලොවෙහි කිසිම රටක ඒ රටේ ඇති සියළු සංස්කෘතීන් සම තත්වයෙහි ලා නො සැලකෙයි. බටහිර රටවල් කෙතරම් බහු සංස්කෘතික කතා කීව ද ඔවුන්ගේ බසින් ම කියන්නේ නම් ඒ නිදාගැනීමට යෑමේ දී කියන කතා පමණ ය. ඒ සැම රටකම අධිපතිවාදී සංස්කෘතියක් වෙයි. එංගලන්තයේ (බ්‍රිතානියේ) ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතියට හිමි ආධිපත්‍යයට අභියෝග කිරීමට පවා වෙනත් කිසිම සංස්කෘතියකට නො හැකි ය. යම් ප්‍රමාණයකටවත්  ඝෝෂාවක් කළ හැක්කේ මුස්ලිම් සංස්කෘතියට පමණ ය. එරට ථෙරවාදී සංස්කෘතියක් තිබෙන බව පවා දැනගත හැක්කේ පන්සල් කිහිපයක පමණ ය. ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියට ආධිපත්‍යයක් නොව විශේෂිත්වයක් පවා හිමිකිරීමට බටහිරයෝ හා ඔවුන්ගේ ගැත්තෝ අකමැති වෙති. සිංහල බෞද්ධ සංස්කෘතියට තැන ලබාදීම යනුවෙන් අද කෙරෙන්නේ වෙනත් ආගමික ප්‍රජකවරුන් විසින් මෙහෙයවනු ලබන ඊනියා සර්ව ආගමික කැරොල් කරත්තවල භික්ෂූන් වහන්සේලා කිහිප නමක් මුලින් තබා උන්වහන්සේලාත් බෞද්ධ ජනතාවත් මුළා කිරීම ය. අවසාන විග්‍රහයේ දී කොටින්ට එළව එළවා පහර දීමට මේ කැරොල් කරත්ත ද විරුද්ධ වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva